# උහුලම වංගුව

## ත්‍රෛලෝක විජයපත්‍ර

අවුරුදු කීපයකට ඉස්සෙල්ලා ත්‍රයිලෝක විජයපත්‍ර ආනයනය සඳහා වැඩ පිළිවෙලක් යෝජනා වෙලා තිබුණාත් කුමක්දෝ හේතුවකට ඒක යට ගියා හොයා ගන්න බැරි විදිහට. දැන් මේ ශාබය ඔස්ට්‍රේලියාවේ ප්‍රධාන අපනයන භෝගයක් විදිහට පත් වෙන්නයි යන්නේ. මේ කියන්නේ මොකක්ද කියලා අවුල් නම් තේරෙන භාෂාවෙන් කංසා කියලාම කියන්නම්කෝ. ඉංගිරිසියෙන් කියනවා නම් කැනබිස්. දැං දන්නවනෙ.

මේක රජකාලේ ඉඳලා බෙහෙතක් බව අපේ මිනිස්සු දැනගෙන හිටියට පාවිච්චි කරන්න වුණේ පොලිසියට හොරෙන්. හැංගි හැංගි පැකට් හදලා බොන්නයි ආයුර්වේද චූර්ණ වලටයි මස් උයද්දි මස් මෙළෙක් වෙන්න දාන්නයි විතරයිනෙ. දැන් මෙන්න ලෝකයම



පිළිගන්න පටන් අරගෙන කංසා කියන්නෙ වේදනා නාශක බෙහෙතක් කියලා. මේක දකින මෙහේ කට්ටිය ඒකට ගානට සෙට් වෙනවා. අපනයන වගාවක් හැටියට ඉස්සරහට ගේන්න. අපි කලින්ම මේක කළා නම් තණමල්විල හම්බන්තොට පැත්තේ එක යායට ගොවිපළවල් දාන්න තිබුණෝ නැද්ද අම්මපා..? මේක ලංකාව වගේ රටකට නියමෙට සෙට් වෙන ශාබයක්නෙ. ශුෂ්ක ප්‍රදේශ වලට නියෙමට ගැළපෙනවා. වතුර අවශ්‍යත් නැහැ ඒ තරම්. අක්කර 100 කට ටොන් 25 ක් විතර අස්වැන්නක් ගන්නත් පුලුවන්. වැඩේ මෙහේ කතා වෙනකොටම චූටි මල්ලි හොයල බැලූවා. යකෝ අපි කළා නම් ඒ කාලෙම ඕස්ට්‍රේලියාවට කෘෂිකාර්මික උපදෙස් දෙන්න තිබුණා අම්මපා. කොහේද ඉතින් සංස්කෘතිය ඉස්සරහට එනකොට මෙලෝ සංසාරයක් ගොඩදාන්න පුලුවනෑ. අපි ඉන්න තත්වෙ හැටියට විකල්ප ආර්ථික ක්‍රියා වලට යා යුතුය කියලා තේරුම් ගන්නේ කවදද අපේ ගොබ්ලෝ ටික ඇත්තට.

## නීතිය හරියට - වෙනසකට සැරසෙමුද

අපි ජීවත් වන මේ රටේ අගමැතිට පොලිසියෙන් දඩයක් ගහනවා. අපි ජීවත්වුණ රටේ නීතිය හා සාමය පිළිබඳ ඇමති දඩයක් ගැහුව කියලා පොලිසියට ගහන්න යනවා. එච්චරක්ද. මරා ගෙ ආණ්ඩුව කාලෙ ඇමතියෙකුට දඩයක් ගැහුවා කියලා පොලිස්කාරයගෙ රස්සාවත් නැති කරලා කාරෙකත් ගිනිතියලා මරන්නත් ගියා. මාරයිනේ වෙනස.

මේව ගැන කොච්චර ලිව්වත් බීරි අලින්ට වීණා වයනවා වගේ උනාට නොලියා කොහොමද? රටක විනය පවත්වාගෙන යන්න නීති රීති අවශ්‍ය වගේම ඒවා ක්‍රියාත්මක කරන්න පොලිසියත් ඉන්න ඕනැනෙ. ඒත් මේ හැම දෙයක්ම පොලිසියට විතරක් කරන්න පුලුවන්ද? පුරවැසියෝ හැටියට අපට නැද්ද මේවා අරක්ෂා කරගන්න වගකීමක් යුතුකමක්?

අගමැතිතුමාගේ දඩය නිකුත්වෙන්නේ ලයිෆ් ජැකට් නැතුව ඩිංගියක ගිය ඡායාරූපයක් හරහා පරීක්ෂන කිරීමෙන්. ඔතනදි වෙලා තියෙන්නෙ කවුරුහරි තරාතිරම නොබලා ඒ ගැන පොලිසියේ අවධානයට යොමු කරපු එකයි. පොලිසිය ඒ කාරණය අතට අරගෙන නීත්‍යාණුකූලව අදාල දඩය ලබාදීලා. එතකොට අපේ ඇමති පොලිසියට තග දාන්නේ තමන්ගේ ගෝලයෝ හෙල්මට් නැතුව බයික් පෙළපාලියක යද්දි පොලිසිය නීතිය ක්‍රියාත්මක කළ නිසා. රටේ නීතිය ආරක්ෂා කිරීමෙදි පුවැසියන්ගේ වගකීම පිලිබඳ අවබෝදයේ වෙනස අපට අපට තේරුම්ගන්න පුලුවන්නෙ. එතකොට අදාල ආයතනය බාර එවුනුත් ක්‍රියාත්මක වෙන විදිහෙන් මෙතන බරපතළ හිඩැසක් තියෙන බව කාටත් පේනවා. මේක නැතිකරන්න හොඳ සිස්ටම් එකක අවශ්‍යතාව දැනෙන්නේ කොයි කාලෙක ඉඳලද දැං. රටට නිදහස ලැබුණ දා ඉඳලා අඩසියවසකටත් වැඩි කාලයක් අපි රටේ සිස්ටම් එක වෙනස් කරන්න දැඟලුවනෙ. ඒක නම් මේ කපේදි වෙන එකක් නෙවෙයි වගේ. ඒ නිසා රටේම



වෙනසට වඩා අපි පුලුවන් විදිහට ගමෙන් වැඩේ පටන් ගත්තොත් මේ ක්‍රමය ටිකක් හරි වෙනස් කරගන්න පුලුවන් වෙයි කියලා චූටි මල්ලිට හිතෙනවා. මේක කරන්න බැරි වැඩක් නෙවෙයි. අපි වෙනස් වෙන්න වෙනස් කරන්න උත්සාහ කරමු. ඒකට ඔන්න අවස්ථාවක් තව මාස දෙකකින් විතර එනවා.

වෙනසක් කරන්න අලුතෙන් හිතන්න අවදානම ගන්න සූදානම් පාලනයක් වගකීම් බාරදෙන්න විශ්වාස කල හැකි නායකයෝ ටිකක් ගමට පත්කරගෙන අපි ගමෙන්ම වැඩේ පටන් ගමු. ඒ වෙනුවෙන් මෙහේ ඉන්න අපට එහේ ඉන්න අපේ අයට යම් බලපෑමක් තෙරපුමක් දෙන්න බලමු. මේක ගොඩගන්න පුලුවන් හොඳ ඔලුගෙඩි ටිකක් විතරයි ඕනෙ. ඒකට ට්‍රයි එකක් දීලා බලමු මිත්‍රවරුනි.

ගම හදන්න ඕනෙ කරන්නෙ අවංක මිනිස්සු ටිකක්. බඩ වඩාගන්නෙ නැති මිනිස්සු ටිකක්. ඒ නිසා ඒ වගේ මිනිස්සු ඉන්න පක්ෂයකට ඡන්දය දෙන එක බුද්ධිමත්. දීලා බැලුවට පාඩුවක් නෑ. මොකද මේක ආණ්ඩුව වෙනස් කරන ඡන්දයක් නෙවෙයිනෙ.

## වික්ටෝරියාවේ වයලන්ස්

කලු මල්ලිලාගේ සෙට් කීපයක් ආපහු වික්ටෝරියාවේ වයලන්ස් වැඩ වලට බැහැලා කියලා අගමැතිතුමා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා වික්ටෝරියාවේ අගමැතිට කිව්වා කියන එන අවුලක හැඩයක් ගන්න බවක් පේන්න තියෙනවා. අද්දැකීමෙන් කියන්නේ එතුමාගේ කතාව ඇත්ත. ඒත් කන්නේ එක මකුණායි මරන්න හදන්නේ ඔක්කොම. වැඩේ තියෙන්නේ මේ මකුණෝ නෙවෙයිනේ. හැම සමාජයකම නානාප්‍රකාර ඩයල් ඉන්නවානේ. ඒ ඒ කට්ටියට ඒ ඒ බනිස් දෙන්න ඕනේ කියලා මෙහේ කට්ටිය දන්නෙම නැද්ද මන්දා. ප්‍රජාතන්ත්‍රවාදේ හා මානව අයිතිවාසිකම් කියන ඒවා තියෙන්න



ඕනෙ තමයි. ඒත් ඒවයේ මුවාවෙන් නීතිය කඩනවා නම් මොකද කරන්නෙ. පාර දෙන්න ඕනෙමයි කියලා තමයි මගේ මිත්‍රයෝ නම් කියන්නෙ. යකෝ දෙයියනේ කියලා සැනසීමෙන් ඉන්න හදනකොට මුං මේ රටත් කන්න හදනවා. පොලිසිය පණමදි කියලාත් කට්ටිය කියනවා. ඒති ඉතිං අපිත් පොඩ්ඩක් හිතලා බැලූවොත් කට්ටිය ආවේ කොහේ ඉඳලාද මොන සමාජයක මොන පීඩනයක් යටතේ ඉඳලද කියලා කට්ටිය ගැන අනුකම්පාවක් ඇතිවේවි. තද කරගෙන හිටපු ප්‍රෙෂර් තමයි අලුතෙන් ආපු ගමන් රිලීස් වෙන්නේ. ටික දවසක් යනකොට ඕව අඩුවෙයි. අර කාලෙකට ඉස්සෙල්ලා නෝබල්පාක් පැත්තෙත් තිබුණෙ ඔයවගේ තත්වයක්නෙ. ඕහොම යං..

## ගින්දරත් එක්ක

ගින්දරත් එක්ක සෙල්ලම් කරන්න හොඳ නෑ කියලා තමයි අපි පොඩි කාලේ ඉඳලම ඉගෙනගත්තෙ. ඒත් ඉතින් හැම කෙනෙකුටම වගේ නරක කාලයක් තියෙනවනෙ. ඒ කාලෙට ඕවායේ බරපතළකම් තේරෙන එකක්යැ. එපා කියන දේමයි කරන්න හිතන්නෙ. කොහොම හරි ඒ දේ කරලා ලබන්නෙ වීර තෘප්තියක්. ප්‍රතිඵලය කුමක්ද කියන එක අදාල වෙන්නෙ නැහැ. පාඩමක් ඉගෙනගන්නෙ පරිප්පුවක් කෑවට පස්සෙ තමයි. ඊයෙ පෙරේදා ක්‍රැන්බර්න් පැත්තෙ ඇතිවුණ ගින්න නිවා ගත්තේ මාර ගේමක් දීලා. ගිනි නිවන හසුදාවේ 300ක් විතර ඇවිත් හිටියා. වාසනාවට එක ගෙයයි ගින්නට අහුවුණේ. ජීවිත හානි මුකුත් නැහැ. පළාතම හොල්මන් වෙලා හිටියේ ටෝටල් ෆයර් බෑන් එකක් දාලා තියෙද්දි මේ ප්‍රදේශයේ කොහොමද මේක වුණේ කියලා. වැඩේ පත්තුවුනේ කොහෙන්ද කියලා හොයාගෙන යනකොට තමයි මුළ අහුවුණේ. ගේම දීලා තියෙන්නෙ පොඩි සෙට් එකක් කියන්නෙ. මේ දැරිවියෝ දෙතුන් දෙනෙක් . උන්න දැන් කට්ටිය අලුත් පාඩමක් ඉගෙනගන්නව ලොකප් එකේ.

මේ වැඩේ නම් සීරියස් කේස් එකක්. තක්කඩිකමට කළත් මේ වගේ වැඩ කරන්නෙ නම් ටිකක් අවුල් කට්ටිය. නඩු අහලා හිරේ දානවට වඩා මේ කට්ටිය පරිවාසෙට දාන එක තමයි කරන්න ඕනෙ. කට්ටිය මේ විදිහට ලොකු උනොත් නම් මාරම අවුලක් තමයි.

## රනිල්ගෙ ඩාන්ස් එක

රනිල් වික්‍රමසිංහ මහත්තය අයිරාංගනී සේරසිංහ නිළි රැජින වටේ යමින් දාපු අපූරු ඩාන්ස් එක ගැන තැන තැන කතා වෙන හැටි චූටි මල්ලිට ඇහුණා. කවුරු මොනවා කිව්වත් චූටි මල්ලි නම් ඒ වැඩේදි රනිල්ට ෆුල් සපෝට්. නායකයෙක් වෙන්න ඕනෙ ගස් ගල් වගේ හිත් පිත් නැති මිනිස්සු නෙමෙයි. ජීවිතයේ සරළ පැත්ත අඳුණන මිනිස්සු. ඒ අර්ථයෙන් රනිල්ගෙ ඩාන්ස් එකට වගේම මහින්දගෙ විස්කි ෂොට් එකටත් චූටි මල්ලිගෙ විරෝධයක් නැහැ. මහින්දගෙ වරද රටට "මතත තිත" කියමින් එයා හොරෙන්ම ෂොට් එකක් දාගන්න එක තමයි.

අනෙක් රටවල නායකයෝ ඩාන්ස් කරද්දි ඒව



බලල සතුටු වෙන අපි අපේ නායකයෙක් ඩාන්ස් කරද්දි ඒක හාස්‍යයට ලක් කරන එක නොම්මර එකේ කුහක කමම තමයි. ඔන්න කෙළින්ම කිව්වා.

මොනවා උනත් මේ වීඩියෝව ප්‍රචාරය කරලා රනිල්ට අපහාසයට උපහාසයට ලක්කරන්න හදපු අගගෙ උත්සාහය බැක්ෆයර් වුණා කියන එක නම් පැහැදිලියියි. මේ වැඩෙන් වුණේ රනිල්ට තවත් ලකුණු ටිකක් වැටිච්ච එක විතරයි.

**චූටි මල්ලි**